ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන අංශය

# ESBM

# ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ සහතික පත්‍ර වැඩසටහන 2018

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
# ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය
# පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන - 2018

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන අංශය මගින් පවත්වනු ලබන ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන - 2018 පිළිබඳ සියළුම විස්තර මෙම අත් පොතෙහි අන්තර්ගත වේ.

මෙහි අඩංගු තොරතුරු වල නිවැරදිතාවය සහතික කරලීම සඳහා සෑම උත්සාහයක්ම දරා ඇති අතර නියෝග වල වෙනසක්, ප්‍රතිපත්තිමය වෙනසක්, මූල්‍යමය වෙනසක්, හෝ වෙනත් කරුණු හේතු කොට ගෙන ඒවා පසුකාලීනව වෙනස් කිරීම් හෝ සංශෝධනවලට භාජනය විය හැකිය.

නාවල,
නුගේගොඩ.

2017 අගෝස්තු

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | අංශ ප්‍රධානතුමාගේ ප්‍රකාශය | 03 |
| 2. | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 04 |
| 3. | කළමනාකරණ අධ්‍යයන අංශය | 05 |
| 4. | ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන | 06 |
| 5. | අමතර තොරතුරු | 09 |
| 6. | වැඩිදුර විමසීම් | 19 |
| ඇමුණුම් | | 20 |

## අංශ ප්‍රධානතුමාගේ ප්‍රකාශය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන අංශය මගින් පවත්වන ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ වැඩසටහනට නවක සිසුන් බඳවා ගන්නා මෙම අවස්ථාවේ මම මෙම පණිවිඩය ඉතා සතුටින් ලබා දෙමි.

රටක දියුණුව සඳහා ව්‍යවසායකත්ව වර්ධනය ඉතාම වැදගත් වේ. ජාතික ආර්ථිකයට ව්‍යවසායකයන්ගෙන් වන දායකත්වය ඉහළ නැංවීමට සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාව අතිවිශාල ප්‍රයත්නයක් ගෙන තිබේ. එමෙන්ම කුඩා ව්‍යාපාර සඳහා සුදුසු වාතාවරණයක්ද ශ්‍රී ලංකාව තුළ පවතී. තත්වය එසේ වුවත්, බොහොමයක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථකත්වයට හේතු ලෙස බොහෝ විට දැකිය හැක්කේ තම ව්‍යාපාරය ඵලදායීතාව හා කාර්යක්ෂමව මෙහෙයවීමට ඇති දැනුම අවම වීමයි.

කළමනාකරණ අධ්‍යයන අංශය මගින් එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලාවක් වන ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ වැඩසටහන හඳුන්වා දෙන්නේ ජාත්‍යන්තර නව ප්‍රවනතා භාවිතයට ගනිමින් හා අධ්‍යාපන පද්ධතියේ වැදගත්කම හඳුනා ගනිමින් වෘත්තීය හා බුද්ධිමය වශයෙන් ව්‍යවසායකයින් බිහි කිරීමටයි. තවද, මෙම පාඨමාලාව සකස් කරන්නේ ව්‍යවසායකයකුට අවශ්‍ය පරිදි සියළුම අත්‍යවශ්‍ය දැනුම හා තමා විසින්ම තම අත්දැකීම් ද මුසුකර ගනිමින් දුරස්ත අධ්‍යාපන ක්‍රමවේදය තුළින් අධ්‍යයනය ලබාදීමේ අටියෙනි.

ඔබ අප සමඟ වැය කරන මෙම කාලය තුළ අපි ඔබගේ අධ්‍යයන කටයුතු සඳහා උපරිම සහය දක්වන්නෙමු.

මගේ ඒකායන බලාපොරොත්තුව ජාතියට වැඩදායී ව්‍යවසායකයින් බිහි කිරීමයි. ඒ සඳහා මම ඔබගේ මෙම අධ්‍යයන වැඩසටහන සාර්ථක වේවායි සුභ පතමි.

ආචාර්ය වී. සිවලෝගතාසන්
අංශ ප්‍රධාන - කළමනාකරණ අධ්‍යයන අංශය.

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පණත යටතේ 1980 දී පර්යේෂණ හා අධ්‍යයන කාර්යයෙහි විශිෂ්ඨත්වය උදෙසා විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය උපයෝගි කරගනිමින් යාවජීව වශයෙන් වැඩිහිටි අධ්‍යාපනය සඳහා ඉඩප්‍රස්ථා පුළුල් කිරිම  මෙහෙවර කර ගනිමින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලදි.  අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාල සතු සියලුම නෛතික සහ ශාස්ත්‍රීය තත්වයම දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මෙරට විවෘත හා දුරස්ථ අධ්‍යාපන ශිල්ප ක්‍රමය යටතේ වැඩි දුර අධ්‍යාපනය ලබා ගතහැකි එකම විශ්වවිද්‍යාලය ලෙස හැඳින්විය හැකිය.

මෙහෙවර මගින් අවධාරණය කරන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි අධ්‍යාපන වැඩසටහන් මූලික වශයෙන් රැකියාවල නියුතු සහ වැඩිහිටි පුද්ගලයන් ඉලක්ක කර ගනිමින් නිර්මාණය කර ඇත.  තමන්ට පවත්නා ඉඩ ප්‍රස්ථා අනුව සිය නිවසේ සිටියදීම සහතික පත්‍රයක් හෝ ඩිප්ලෝමාවක් හෝ උපාධියක් හෝ පශ්චාත් උපාධියක් ලබාගත හැකි වන පරිදි වැඩසටහන් නිර්මාණය කර තිබීම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි සුවිශේෂී ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකිය.

වර්තමානයේදී දීප ව්‍යාප්තව සිටිනා 35000 කට අධික ශිෂ්‍ය සංඛ්‍යාවකට පීඨ පහක් (මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය, ඉංජිනේරු සහ තාක්ෂණ විද්‍යා පීඨය, ස්වාභාවික විද්‍යා පීඨය, සෞඛ්‍ය විද්‍යා පීඨය සහ අධ්‍යාපන පීඨය) යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් අධ්‍යයන පාඨමාලා මෙහෙයවනු ලබයි.  එසේම  රටපුරා විසිරී පවතින ප්‍රාදේශීය මධ්‍යස්ථාන සහ අධ්‍යයන මධ්‍යස්ථාන ජාලය මගින් අවහිරයකින් තොරව අධ්‍යයන කටයුතු කරගෙන යාමට සිසුන්ට ඉඩ ප්‍රස්ථාව ලබා දී තිබීම සුවිශේෂි කොට දැක්විය හැක.

## කළමනාකරණ අධ්‍යයන අංශය

කළමනාකරණ විෂයට අදාළව දැනුම, හැකියාවන් සහ ආකල්ප වර්ධනය කිරීමේ මූලික අරමුණින් 1980 දශකයේ මැද භාගයේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අනුබද්ධිතව කළමනාකරණ අධ්‍යයන අංශය ආරම්භ කරන ලදි.

වර්තමානයේදී අධ්‍යයන අංශය මගින් සහතික පත්‍ර පාඨමාලාවේ සිට පශ්චාත් උපාධිය දක්වා අධ්‍යයන පාඨමාලාවන් පවත්වා ගෙන යනු ලබයි. ඒවා නම්

- ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ එක් අවුරුදු සහතික පත්‍ර වැඩ සටහන (ESBM)
- කළමනාකරණ ඩිප්ලෝමා වැඩ සටහන (DM)
- කළමනාකරණ අධ්‍යයනවේදී උපාධි වැඩ සටහන (BMS)
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති උපාධි වැඩසටහන (MBA in HRM)
- පොදු රාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනපති සහ රාජ්‍ය පරිපාලනපති උපාධි වැඩසටහන් (CEMBA/CEMPA)

## ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

රටක සංවර්ධනය කෙරෙහි බලපාන අතිශය වැදගත් වන සාධකයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හැඳින්විය හැකිය. මෙරට ස්ථාපිත බොහෝමයක් ව්‍යාපාරික ආයතන මෙකී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයට ගැනෙන අතර, එකී ව්‍යාපාර දිරි ගැන්වීම සහ නගා සිටුවීම සඳහා රජය මගින් නොයෙකුත් ක්‍රියාමාර්ග ගෙන තිබීම සුවිශේෂී කොට සැලකිය හැකිය. නමුත් ව්‍යාපාර ස්ථාපිත කිරීම සහ පරිපාලනය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීම හේතු කොට ගෙන සුභවාදී ව්‍යාපාර පරිසරයක් පැවතුනද මෙකී ව්‍යාපාර තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කර ගැනීමට අපහසු වී ඇති අතර, බොහෝ විට ව්‍යාපාර අසාර්ථක වීම් දක්නට ලැබේ. මෙකී තත්වයට විසඳුමක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නිරත වන ව්‍යවසායකයින්ට සහ එකී ව්‍යාපාර ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් පසුවන්නන්ට අවශ්‍ය මූලික දැනුම ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි කළමනාකරණ අධ්‍යයන අංශය මගින් ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන හඳුන්වා දී ඇත.

### පාඨමාලා අරමුණු

- පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වනුයේ ජාතික ආර්ථිකයට සක්‍රියව දායක වන ව්‍යවසායකයින් පිරිසක් බිහි කිරීමට දායක වීමයි.

- විශේෂිත අරමුණු
  - සාර්ථක ව්‍යවසායකයකු බවට පත්වීමට අවශ්‍ය කරන දැනුම, කුසලතා සහ ආකල්ප සහභාගි වන්නන් තුළ වර්ධනය කිරීම.
  - දැනුම සහ කුසලතාවයෙන් පරිපූර්ණ වූ තරුණ තරුණියන් ස්වයං රැකියා අවස්ථා සඳහා දිරි ගැන්වීම.

### පාඨමාලා ව්‍යූහය

- කාලය:
  අධ්‍යයන වර්ෂ 01

- මාධ්‍යය:
  සිංහල/ඉංග්‍රීසි/දෙමළ (තමා තෝරාගත් මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීම සඳහා ප්‍රමාණවත් හැකියාවක් තිබිය යුතුය)

- ඇතුළත්වීමේ සුදුසුකම්:
  අයදුම්පත් භාරදෙන අවසාන දිනට වයස අවු: 18 හෝ ඊට වැඩිවීම සහ
  - විවෘත විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවන සමාජ විද්‍යා පදනම් පාඨමාලාවේ පළමුවන මට්ටම සාර්ථකව නිම කිරීම හෝ
  - විවෘත විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවන පදනම් පාඨමාලාවකින් සම්මාන 2 ක් ලබා ගැනීම හෝ නිදහස් වීමක් ලබා ගැනීම හෝ
  - දෙවරකට නොවැඩි වාර ගණනකදී අ:පො:ස: (සා:පෙ:) ගණිතය හා භාෂාව ඇතුළුව ඕනෑම විෂයයන් 6 කින්
    සමත්වීම හෝ
  - විශ්ව විද්‍යාල සනාතන සභාවට පිළිගත හැකි වෙනත් ඕනෑම සුදුසුකමක් තිබීම.

(අවශ්‍ය වුවහොත් ඇතුළත්වීමේ පරීක්ෂණයක් පවත්වනු ඇත)

- පාඨමාලා අන්තර්ගතය:
  පාඨමාලාව විෂයයන් හතකින් සමන්විත වේ.

  - MCC 1201 – ව්‍යවසායකත්වය
  - MCC 1202 – කුඩා ව්‍යාපාර කළමනාකරණය
  - MCC 1103 – මූලික සංඛ්‍යානය හා ආර්ථික විද්‍යාව
  - MCC 1204 – අලෙවිකරණය හැඳින්වීම
  - MCC 1105 – මෙහෙයුම් කළමනාකරණය හැඳින්වීම
  - MCC 1206 – ගිණුම් හා මූල්‍ය හැඳින්වීම
  - MCC 1207 – ව්‍යාපෘති වාර්තාව

  සිසුන් විසින් ලිවීමට අපේක්ෂිත ව්‍යාපෘති වාර්තාව මගින් ඔවුන් හට තමන්ට කැමති ව්‍යාපෘතියක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවකාශ සලසා දෙන අතර මේ සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහයද ඔවුන්ට හිමිවේ.

- ඇගයීමේ ක්‍රමය:

  ශිෂ්‍යයකුගේ නිපුනත්වය මිණුම් 3 ක් මත අගයනු ලැබේ.
  - පැවරුම්
  - ව්‍යාපෘති වාර්තාව
  - අවසාන පරීක්ෂණය

- පාඨමාලා ගාස්තු:

  සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු.19,500/- ක් වන අතර එය වාරික දෙකකින් ගෙවිය හැකිය.

| | |
|---|---|
| 1 වන වාරිකය | රු. 12 000.00 |
| 2 වන වාරිකය | රු. 7 500.00 |
| මුළු ගාස්තුව | රු. 19 500.00 |

- සහතිකය ප්‍රදානය කිරීම:

  අවසාන පරීක්ෂණය සාර්ථකව නිම කරන සිසුන්හට විවෘත විශ්වවිද්‍යාලයේ නීතිරීති වලට යටත්ව ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ සහතික පත්‍රය පිරිනැමෙනු ඇත.

  තවද, පාඨමාලාව සාර්ථකව නිම කරන සිසුන් හට ඇතුළත් වීමේ පරීක්ෂණයට ඉදිරිපත් නොවී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි කළමනාකරණ අධ්‍යයන අංශය මගින් ප්‍රධානය කරනු ලබන විද්‍යාවේදී කළමනාකරණ අධ්‍යයන උපාධි පාඨමාලාව සඳහා ඇතුළත් විය හැකිය.

# අමතර තොරතුරු

## පාඨමාලා සහ අධ්‍යයන වැඩසටහන්

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල වාග් මාලාවට අනුව පාඨමාලාවක් යනුවෙන් අදහස් කරන්නේ සාමාන්‍යයෙන් එක් අධ්‍යයන වර්ෂයක් තුළ දී සම්පූර්ණ කරනු ලබන විෂය ක්ෂේත්‍රයකි.

- අනිවාර්යය සහ වෛකල්පිත පාඨමාලා එකතුවෙන් අධ්‍යයන වැඩසටහනක් සෑදේ. අනිවාර්ය පාඨමාලා යනු කිසියම් වැඩ සටහනක අවශ්‍යතා සපුරාලීම සඳහා ශිෂ්‍යයන් විසින් අවශ්‍යයෙන්ම සම්පූර්ණ කළ යුතු වූ පාඨමාලා වේ. අධ්‍යයන වැඩ සටහනක් සාර්ථක ලෙස හදාරා නිම කිරීම සහතිකයක්, ඩිප්ලෝමාවක් හෝ උපාධියක් ප්‍රධානය කරනු ලැබීමට සුදුසුකමක් වේ.

- විවෘත විශ්වවිද්‍යාලය ඉදිරිපත් කරන අධ්‍යයන වැඩසටහන් පහත සඳහන් ප්‍රභේද අතුරින් එකකට අයත් වේ.
  - පදනම් වැඩ සටහන්
  - සහතික පත්‍ර
  - ඩිප්ලෝමා
  - ප්‍රථම උපාධි
  - පශ්චාත් ඩිප්ලෝමා
  - පශ්චාත් උපාධි සහ
  - දර්ශනශූරි උපාධි
  - වැඩිදුර අධ්‍යයන වැඩසටහන්

- පදනම් වැඩසටහන් සෙසු අධ්‍යයන වැඩසටහන් වලට ඇතුළුවීමේ දොරටුව වේ. මූලික අධ්‍යයන ක්ෂේත්‍රය තුළ මෙම පදනම් වැඩ සටහන් පළමුවන (පදනම 1) සහ දෙවන (පදනම 2) යනුවෙන් මට්ටම් දෙකකින් පවත්වනු ලැබේ. විවෘත විශ්වවිද්‍යාලයීය පදනම් වැඩසටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශිෂ්‍යයෙක් සම්ප්‍රදායික විශ්වවිද්‍යාල වලට ඇතුළු වීම සඳහා අවශ්‍ය අධ්‍යාපන මට්ටමට සමාන මට්ටමකට එළඹෙයි.

- අක්ෂර තුනකින් සහ සංඛ්‍යා හතරකින් සමන්විත පාඨමාලා කේතයන් පහත සඳහන් පරිදි එක් එක් පාඨමාලාවට ලබා දී ඇත.
    - පළමුවන අක්ෂර දෙක මගින් අධ්‍යයන ක්ෂේත්‍රය දැක්වේ. (1 වන වගුවේ දක්වා ඇති පරිදි)
    - තුන්වන අක්ෂරය හා පළමුවන සංඛ්‍යාංකය මගින් පාඨමාලා මට්ටම සහ වැඩ සටහන් ප්‍රභේදය දැක්වේ. (2 වන වගුවේ දක්වා ඇති පරිදි)
    - දෙවන සංඛ්‍යාංකය මගින් සම්මාන ප්‍රමාණය දැක්වේ. ( 3 වන වගුවේ දක්වා ඇති පරිදි)
    - අවසාන සංඛ්‍යාංක දෙක මගින් අදාළ පාඨමාලාවට දී ඇති සුවිශේෂ අනුක්‍රමික අංකය දැක්වේ.

1 වන වගුව: මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයෙහි ඇති අධ්‍යයන ක්ෂේත්‍ර

| **අධ්‍යයන ක්ෂේත්‍රය** | **කේතය** |
|---|---|
| භාෂා | LS |
| නීති | LW |
| කළමනාකරණ | MC |
| සමාජ විද්‍යා | SS |

2 වන වගුව: පාඨමාලා මට්ටම්

| **අධ්‍යයන වැඩ සටහන** | | | | | | **වැඩිදුර අධ්‍යයන පාඨමාලා** |
|---|---|---|---|---|---|---|
| **මට්ටම** | **පදනම** | **සහතික පත්‍ර** | **ඩිප්ලෝමා** | **උපාධි** | **පශ්චාත් උපාධි** | |
| 0 | | | | | | E0 |
| 1 | F1 | C0 | | | | E1 |
| 2 | F2 | C1 | | | | E2 |
| 3 | | C2 | D1 | U1 | | E3 |
| 4 | | | D2 | U2 | | E4 |
| 5 | | | | U3 | | E5 |
| 6 | | | | U4 | P1 | E6 |
| 7 | | | | | P2 | E7 |

3 වන වගුව: සම්මාන ප්‍රමාණය

| **සම්මාන ප්‍රමාණය** | 1 | 2/3 | 1/2 | 1/3 | 1/6 | 0 |
|---|---|---|---|---|---|---|
| **කේතයේ දෙවන සංඛ්‍යාංකය** | 6 | 4 | 3 | 2 | 1 | 0 |

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ක්‍රමය

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් ශිෂ්‍යයන් වෙත දැනුම ලබාදෙනු ලබන්නේ දූරස්ථ අධ්‍යාපන ක්‍රමය මගිනි. මේ ක්‍රමයේදී ශිෂ්‍යයන් හා දේශකවරු වැඩි වශයෙන් දූරස්ථව සිටිති. අධ්‍යයන කටයුතු මුද්‍රිත පාඩම් කට්ටල, ශ්‍රව්‍ය දෘශ්‍යාධාර හා දින පාසල් මගින් සපුරා ගත හැකිවේ. දින පාසල් පැවැත්වීමේ අරමුණ වන්නේ සිසුනට සිය ආචාර්ය මණ්ඩලය හමුවී අධ්‍යයන ගැටළු විසඳා ගැනීමට අවස්ථාව සැලසීමයි. ශිෂ්‍ය සාධනය අගයනු ලබන්නේ අඛණ්ඩ ඇගයීම් හා අවසාන පරික්ෂණ මගිනි.

- **මුද්‍රිත ද්‍රව්‍ය**

  දූරස්ථ ඉගෙනුම් ක්‍රමයෙහි ප්‍රධාන මාධ්‍යය වන්නේ ශිෂ්‍යයාට දෙනු ලබන මුද්‍රිත පත පොතයි. මේවායින් විවිධාකාර වූ කාර්යයන් ඉටු කෙරේ. අධ්‍යයනය කළයුතු මූලික දේ එමගින් ශිෂ්‍යයාට සැපයේ. දේශන මගින් වන මෙහෙය ඉන් ඉටුවන අතර, කරුණු විශ්ලේෂණය කර අධ්‍යයනය කළයුතු විවිධ ක්‍රම සංසන්දනය කරමින් සැලකිල්ලෙන් සකස් කර ඇති ප්‍රශ්ණ මාලාවක්ද පත පොතෙහි අඩංගුව ඇත. එමගින් අපේක්ෂා කෙරෙන්නේ ශිෂ්‍යන්ගේ ස්වාධීන ලෙස සිතීමේ හැකියාව, ස්වාධීන අධ්‍යයන කටයුතුවල නියැලීමේ හැකියාව සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විශ්ලේෂණ ශක්තිය වැඩි දියුණු කිරීමයි.

- **ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපකරණ**

  ස්වයං අධ්‍යාපනය ලබන්නෙකුට මෙම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපකාරක විශේෂයෙන් වැදගත් වේ. ඒ ඒ පාඨමාලාවට අදාළ වීඩියෝ පට නැරඹීමට සැලැස්වීමෙන් ඉගෙනුම් කටයුතු වල යෙදීමෙහි ලා ශිෂ්‍යයා උනන්දු කරවන අතර විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය විසින් හා ඒ ඒ ක්ෂේත්‍රවල

නියැලී විශේෂඥයින් විසින් සකසන ලද ශ්‍රව්‍ය කැසට් පටවලට සවන්දීමේ අවස්ථාවද ශිෂ්‍යයාට ලැබෙනු ඇත.

- **දිවා පාසල්**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය දුරස්ථ අධ්‍යාපන ක්‍රමයෙහි ලා මුද්‍රිත ද්‍රව්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපකරණ මූලික වන බව අතර ඊට අමතරව ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානයන්හි වරින් වර දිවා පාසල් පවත්වනු ලබයි.මෙම දිවා පාසල් මගින් මූලික වශයෙන් විෂය කරුණු ආශ්‍රිතව පැන නගින ගැටළු නිරාකරණය කරදීම සිදු කෙරෙන අතර එහිදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර හා බාහිර ආචාර්ය මණ්ඩලය සමග මුහුණට මුහුණ ලා අධ්‍යයන ගැටලු සාකච්ඡා කිරීමට සිසුනට අවස්ථාව සැලසේ.

- **පැවරුම් හා විභාග**

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් හදාරණ සම්පූර්ණ කාල සීමාව තුළ ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් වැඩ කටයුතු නිරතුරුවම ඇගයීමට ලක් කරනු ලැබේ. ශිෂ්‍යයන් විසින් පැවරුම් කීපයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර ඒවා ලකුණු කොට උපදේශකවරයාගේ ගුණදොස් විවේචනයද සහිතව ශිෂ්‍යයන්ට ආපසු භාර දෙනු ලැබේ. මෙය "අඛණ්ඩ ඇගයුම" නමින් හැඳින්වේ. මෙම පැවරුම් වල ව්‍යුහය හා සංඛ්‍යාව අදාල අංශය තීරණය කරන අතර පාඨමාලාවෙන් පාඨමාලාවට සහ වසරින් වසරට මේවා වෙනස් විය හැක. සංවෘත ග්‍රන්ථ පරීක්ෂණ, විවෘත ග්‍රන්ථ පරීක්ෂණ, පැවරුම් (නිවසේ සිට පිළිතුරු සපයන), ව්‍යාපෘති යෝජනා යනාදි ස්වරූපයන්ගෙන් මෙම පැවරුම් සකස් විය හැකිය.

අධ්‍යයන වැඩසටහනක ලියාපදිංචි වීමෙන් පසුව තමන්ට දෙනු ලබන උපදෙස් පත්‍රිකාව සිසුන් විසින් කියවිය යුතු අතර අඛණ්ඩ අධ්‍යයන සහ අඛණ්ඩ ඇගයුම් වල වැදගත්කම අවබෝධ කරගත යුතුය. කිසිම ශිෂ්‍යයෙකුට යෝග්‍යතාවය ලබා ගැනීමෙන් තොරව වර්ෂ අවසාන විභාගයට පෙනී සිටීම සඳහා මෙම අධ්‍යයන වැඩසටහන් මගින් අනුබල දෙනු නොලැබේ. අඛණ්ඩ ඇගයීම් වලින් සාමාර්ථයක් ලබා තිබීමෙන් අවසාන විභාගය සඳහා පෙනී සිටීමට යෝග්‍යතාවය හිමිවන අතර එසේ සාමාර්ථය නොලබන කිසිදු ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට අවසාන විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

සෑම අධ්‍යයන වැඩසටහනක් අවසානයේදීම අවසාන පරීක්ෂණයක් පවත්වනු ලැබේ. අවසාන ශ්‍රේණිය තීරණය වන්නේ පැවරුම් හා අවසාන පරීක්ෂණය සඳහා ලබාගත් සමස්ථ ප්‍රතිඵලය අනුවය. අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා යෝග්‍යතාවය නොලබන සිසුන් අදාල පාඨමාලාව සඳහා නැවත ලියාපදිංචි විය යුතුය.

යෝග්‍යතාවය ලබා තිබුණද අවසාන පරීක්ෂණයෙන් අසමත් වන සිසුනට යලි අදාල පාඨමාලාව සඳහා වන අවසාන පරීක්ෂණයට පමණක් පෙනී සිටීමට සිදුවේ. එනම් මෙම සිසුනට නැවත යෝග්‍යතාවය ලබා ගැනීම අවශ්‍ය නොවනු ඇත. නමුත් ඔවුන් ලියාපදිංචියේදී ශිෂ්‍යභාවය ලබාගත යුතුය.

- **ප්‍රාදේශීය සේවා**

දිවයින පුරා විසිරුණු ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන ජාලයක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයය සතුවේ. මෙම මධ්‍යස්ථාන මගින් දිවා පාසල් පැවැත්වීම, පුස්තකාල පරිශීලන පහසුකම් ලබා දීම, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකාරක සේවා සැපයීම, මුද්‍රිත පතපොත ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය බෙදාහැරීම, විභාග පැවැත්වීම හා ශිෂ්‍ය උපදේශන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම ද කරනු ලැබේ. මෙම පහසුකම් නිරන්තරයෙන්ම වැඩි දියුණු කරනු ලබයි.

4 වන වගුව: විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන

| **පිහිටීම** | **කේතය** | **ලිපිනය** | **දුරකතනය** |
|---|---|---|---|
| කොළඹ | WP10 | නාවල, නුගේගොඩ. | 011 2853930 |
| නුවර | CP20 | පොල්ගොල්ල, මහනුවර. | 081 2494084 |
| මාතර | SP30 | නූපේ, මාතර. | 041 2222943 |
| යාපනය | NP40 | බ්‍රවුන්ස් පාර, කොකුවිල්ල යාපනය. | 021 2223374 |
| අනුරාධපුරය | NC50 | ජයන්ති මාවත, අනුරාධපුරය. | 025 2222871 |

| පිහිටීම | කේතය | ලිපිනය | දුරකතනය |
|---|---|---|---|
| මඩකලපුව | EP60 | 23, අළුත් පාර,මඩකලපුව. | 065 2222264 |
| කුරුණෑගල | NW70 | මීගමුව පාර, (නිශ්ශංක මාවත හන්දිය) මල්කඩුවාව, කුරුණෑගල. | 037 2223473 |
| බදුල්ල | UP80 | කාර්මික විද්‍යාලය, බදුල්ල. | 055 3012151<br>055 2228842 |
| රත්නපුර | SG90 | හිදෙල්ලෙන, රත්නපුර. | 045-2228660 |

5 වන වගුව: විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මධ්‍යස්ථාන

| පිහිටීම | කේතය | ලිපිනය | දුරකතනය |
|---|---|---|---|
| ගම්පහ | WP11 | ගම්පහ පාර, මිරිස්වත්ත, මුදුන්ගොඩ. | 033 2234571/2 |
| කළුතර | WP12 | නො 66/2, නාගොඩ පාර, කළුතර. | 034 2223399<br>034 3949160 |
| හැටන් | CP21 | තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, හැටන්. | 051 2225139<br>051 2223492 |
| අම්බලන්ගොඩ | SP31 | 81/1,පොල්වත්ත පාර, හල්වතුර, අම්බලන්ගොඩ. | 091 2258585 |
| ගාල්ල | SP32 | ලබුදූව, ගාල්ල. | 091 2223784 |
| අම්බලන්තොට | SP33 | රාජසරණගම පාර, දකුණු ලුනම, අම්බලන්තොට. | 047 2220940<br>047 2225533 |
| වව්නියාව | NP41 | නො.366, නුවර පාර, තේක්කවත්ත, වව්නියාව. | 024 2222995 |
| කිලිනොච්චි | NP42 | 155 වෙනි සැතපුම් කනුව, නුවර පාර, කිලිනොච්චි. | 021 2283970 |
| මුලතිව් | NP43 | අතිපරශක්ති අරිවියල් විද්‍යාලය, කොට්ඨාශ 04, ඉරනයිපලෛයි, මුලතිව්. | 071 3522367 |
| මන්නාරම | NP44 | තලෛයිමන්නාරම පාර, මන්නාරම | 077 5625352 |

| පිහිටීම | කේතය | ලිපිනය | දුරකතනය |
|---|---|---|---|
| පොළොන්නරුව | NC51 | 24 කණුව, බෙන්ඩිවැව, ජයන්තිපුර. පොළොන්නරුව. | 027 2223048 |
| අම්පාර | EP61 | ඉගනියාගල පාර, සාමපුර, අම්පාර. | 063 2222052<br>063 2222056 |
| ත්‍රිකුණාමලය | EP62 | විවේකානන්ද විද්‍යාලය, ඕර්ස් හිල්, ත්‍රිකුණාමලය. | 026 3264813 |
| පුත්තලම | NW71 | 1/37, කොළඹ පාර, පුත්තලම. | 032 2266822 |
| කුලියාපිටිය | NW72 | කාර්මික විද්‍යාලය, කුලියාපිටිය. | 037 2281181<br>037 2281271 |
| බණ්ඩාරවල | UP81 | සාන්ත තෝමස් මාවත, වැවතැන්න, බණ්ඩාරවෙල. | 057 2222820 |
| මොණරාගල | UP82 | කාර්මික විද්‍යාල හන්දිය, සිරිගල, පොතුවිල් පාර, මොණරාගල. | 055 2277395 |
| කෑගල්ල | SG91 | කුමාරතුංග මුණිදාස මාවත, කෑගල්ල. | 035 2222501 |

- **පුස්තකාල පහසුකම්**

විවෘත විශ්වවිද්‍යාලයීය කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ හා අනෙකුත් මධ්‍යස්ථානවල පුස්තකාල පහසුකම් සලසා තිබේ. ඉහළ මට්ටම් වලට අවශ්‍ය වන ආශ්‍රිත ග්‍රන්ථ ආදිය සඳහා පහසුකම් නාවල මධ්‍යම පුස්තකාලයෙන් සැපයෙනු ඇත. පුස්තකාල පහසුකම් පරිහරණය කිරීම සඳහා සිසුන්හට විශේෂයෙන්ම උපදෙස් දෙනු ලබන්නේ එය අධ්‍යාපන ක්‍රමයේ ඉතා වැදගත් අංගයක් බැවිනි. විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි කිසියම් හෝ පුස්තකාල පහසුකමක් සලසා දීම සඳහා සෑම වෑයමක්ම දරා තිබේ. කෙසේ නමුත් උපරිම පහසුකම් නාවල මධ්‍යම පුස්තකාලයේ ඇති බැවින් එය පරිශීලනය කිරීමට සිසුනට අනුබල දෙනු ලැබේ.

විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාල ක්‍රමය අනෙකුත් සාම්ප්‍රදායික අධ්‍යයන පුස්තකාල මගින් වෙනස් වන්නේ එමගින් දිවයින පුරා විසිරී සිටින සිසුන්

විශාල සංඛ්‍යාවකගේ අවශ්‍යතාවයන් සඳහා පහසුකම් සපයන බැවිනි. ඒ අනුව විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාල ක්‍රමය මගින් ආශ්‍රිත ග්‍රන්ථ පරිශීලනය කිරීමේ හා පොත්පත් බැහැර ගෙන යාමේ පහසුකම් කාර්ය මණ්ඩලය වෙත සලසා ඇති අතර පසු දින ආපසු භාරදීමේ පදනම මත පොත් බැහැර ගෙන යාමේ සීමිත පහසුකම් සිසුන් වෙත සැපයේ. කෙසේ නමුත් ආශ්‍රිත ග්‍රන්ථ පරිශීලනය කිරීම සඳහා විවෘත විශ්වවිද්‍යාලය සිසුන් වෙත සලසා ඇති පහසුකම් සීමා කර නොමැත.

- **ගාස්තු හා වෙනත් වියදම්**

අධ්‍යයන වැඩසටහනක් සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවෙකුට ලියාපදිංචි වීමේ හා ශිෂ්‍ය උපදේශන ගාස්තු සහ ඒවා ගෙවිය යුතු දින සඳහන් වවුචරයක් ලැබෙනු ඇත. නියමිත දින හෝ ඊට පෙර ගාස්තු නොගෙවුවහොත් පාඨමාලා සඳහා ලියාපදිංචි කරනු නොලැබේ.

ඉල්ලුම් කරනු ලැබූ අවස්ථාවක අදාල ශිෂ්‍ය උපදේශන ගාස්තු ගෙවිය යුතුවන අතර එය අප්‍රමාදව සිදුවිය යුතු වේ. පූර්ව දැණුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවක මෙම ගාස්තුව හා අනෙකුත් සියළුම අයකර ගැනීම සංශෝධන කිරීමේ බලය විශ්වවිද්‍යාලය සතුවේ. ගෙවන ලද ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

නේවාසික හෝ දිවා පාසල් ගාස්තු ශිෂ්‍ය උපදේශන ගාස්තුව තුළ ඇතුළත්ව නොමැතිවාක් මෙන්ම නියමිත ග්‍රන්ථ සඳහා වියදම් හෝ ශිෂ්‍යයෙකු ඔහුගේ අධ්‍යයන කටයුතු වලදී දරන්නාවූ අනියම් වියදම්ද එහි ඇතුළත් කර නොමැත.

ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය දැක්වෙන වවුචර් වල ගාස්තු වල ගෙවන ක්‍රමය සඳහන් කෙරෙනු ඇත. ශිෂ්‍ය උපදේශන ගාස්තු වාරික දෙකකින් ගෙවිය හැක. පළමුවන වාරිකය ලියාපදිංචි වන දින ගෙවිය යුතුය.

පාඨමාලා ගාස්තු වශයෙන් දක්වා ඇති අගයට වාර්ෂිකව 10% බැගින් එකතුවන බව සිසුන් මතක තබා ගත යුතුය. එමෙන්ම යම් සිසුවෙක් කිසියම් පාඨමාලාවක් සඳහා යෝග්‍යතාවය ලැබීමට අසමත් වී ඒ සඳහා නැවත ලියාපදිංචි වන්නේ නම් අදාල පාඨමාලා ගාස්තුව මෙන් දෙගුණයක් ගෙවිය යුතු වේ.

- **ලියාපදිංචි කිරීම**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් හැදෑරීමට අපේක්ෂා කරන සිසුන් අදාළ ලියාපදිංචිය සිදු කරන කාල සීමාව තුළ නියමිත ගාස්තු ගෙවා ලියාපදිංචිය ලබා ගැනීම අවශ්‍ය වේ.

සිසුන් විසින් තෝරාගනු ලබන විෂයය ක්ෂේත්‍ර පිළිබඳ ශිෂ්‍ය උපදේශන කටයුතු ලියාපදිංචිය සිදු කරන අවස්ථාවේදී පැවැත්වෙන බැවින් ලියාපදිංචි වීම සඳහා අදාළ සිසුන්ගේ සහභාගීත්වය අවධාරණය කෙරේ.

ලියාපදිංචිය සඳහා අදාල ශිෂ්‍යයා/ශිෂ්‍යාවට පැමිණිය නොහැකි අවස්ථාවකදී ඔහු/ඇය නියෝජනය කිරීම සඳහා බලය පවරනු ලැබූ වෙනත් පුද්ගලයෙකු මගින් ලියාපදිංචිය සිදුකර ගැනීමට හා අදාළ අනෙකුත් විස්තර ලබා ගැනීමට අවකාශ ඇත.

සිසුන් ලියාපදිංචි කිරීම ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලදී සහ තෝරාගත් අධ්‍යයන මධ්‍යස්ථාන වලදී සිදු කෙරේ. කෙසේ වෙතත් කිසියම් මධ්‍යස්ථානයක ශිෂ්‍ය ලියිපදිංචිය සිදු කිරීම එකී මධ්‍යස්ථානය තෝරා ගෙන ඇති ශිෂ්‍ය සංඛ්‍යාව මත තීරණය වේ.

එක් අධ්‍යයන වර්ෂයක් සඳහා කිසියම් ශිෂ්‍යයෙකුට ලියාපදිංචිය ලබාගත හැකි පාඨමාලාවන්ගේ අවම හා උපරිම සීමාවන් විශ්වවිද්‍යාලය මගින් නියම කර ඇත. ඒ අනුව එක් අධ්‍යයන වර්ෂයක් සඳහා සම්මාන දෙකක උපරිමයකට යටත්ව අධ්‍යයන වැඩ සටහන් දෙකක් සඳහා ලියාපදිංචිය ලබා ගත හැකිය. ඊට අමතරව සම්මාන 1/2 ක උපරිමයකට යටත්ව අඛණ්ඩ අධ්‍යයන පාඨමාලාවන්ට (අඛණ්ඩ අධ්‍යයනය යටතේ පරිගණක වැනි වැඩ සටහන් වලට) ලියාපදිංචි වීමට අවසරය ඇත.

එකවර අධ්‍යයන වැඩසටහන් දෙකක් සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු හා විභාග සම්බන්ධව යම් අපහසුතාවයක් ඇතිවීමට ඉඩ ඇති අතර එවැනි අපහසුතාවයන් පිළිබඳව විශ්වවිද්‍යාලය කිසිදු වගකීමක් දරනු නොලැබේ. කෙසේ වෙතත් පළමුවර ලියාපදිංචි වන අවස්ථාවේදී හුදෙක් ශිෂ්‍යභාවය සඳහා පමණක් ලියාපදිංචි වීමට (පාඨමාලාවන් සඳහා ලියාපදිංචි නොවී) කිසිඳු ශිෂ්‍යයෙකුට අවසර දෙනු නොලැබේ. ඔහු/ඇය එම අවස්ථාවේදී යටත් පිරිසෙයින් සම්මාන 1/2 ක පාඨමාලා සඳහා ලියාපදිංචි විය යුතුය. ශිෂ්‍යභාවය සඳහා ලියාපදිංචි කිරීම කාලච්ඡේද (Semesters)

දෙකකින් යුත් පාඨමාලාවන් සඳහා නැවත ලියාපදිංචි කිරීමේ අවසන් දින සිට මාස 5 ක කාලයක් දක්වාද අතිකුත් සියඵම පාඨමාලාවන් සඳහා මාස 7 ක් දක්වාද සිදු කරනු ඇත. ලියාපදිංචියෙන් මාස තුනක කාල පරිච්ජේදයක් තුළදී තමා තෝරාගත් විෂයයන් මාරු කිරීමේ හැකියාව සිසුන් හට ලැබේ.

**සටහන :**

පාඨමාලාවට අදාල නීති මාලාව 2019 ජනවාරි 01 දින සිට වෙනස් වීමට භාජනය වන බැවින් මෙම අධ්‍යයන වර්ෂය තුළදීම පාඨමාලාව සාර්ථකව නිම කර සහතික පත්‍රය ලබා ගැනීමට උනන්දු වන්න.

## වැඩිදුර විමසීම්

## ESBM කමිටුව

ජනක හීන්කෙන්ද මයා
ප්‍රධාන සම්බන්ධීකාරක
දුරකතන අංකː 0112 881 024 / 0112 881 255

ආචාර්ය සුනීතා විජේකුමාරන් මිය
අධ්‍යයන සම්බන්ධීකාරක - දමිළ
දුරකතන අංකː 0112 881 024 - 0112 881 255

හරිනි පෙරේරා මෙනෙවිය
අධ්‍යයන සම්බන්ධීකාරක
දුරකතන අංකː 0112 881 024 / 0112 881 255

තිලක්ෂි වික්‍රමසූරිය මෙනවිය
වැඩසටහන් සහායක - සිංහල/ ඉංග්‍රීසි
දුරකතන අංකː 0112 881 024 / 0112 881 255

එම්. එම්. ඒ. ලතීෆ් මයා
සම්බන්ධීකාරක - දමිළ
දුරකතන අංකː 0112 881 024 / 0112 881 255

පහත දැක්වෙන ලිපිනයෙන් මෙම පාඨමාලාවට ලියාපදිංචි වීම සම්බන්ධ වැඩිදුර විස්තර ලබා ගත හැක.

මහජන සම්බන්ධතා හා තොරතුරු අංශය
තැ.පෙ. අංක 21
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය,
නාවල,
නුගේගොඩ.

දුරකථන අංක: 0112 881 327/ 0113 182 161

ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාවට අදාළ අයදුම්පත් අන්තර්ජාලය මගින් ලබා ගත හැකිය. ඒ සඳහා පහත පියවර අනුගමනය කරන්න.

**පියවර 1**

www.ou.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**පියවර 2**

තිරයේ වම්පස ඇති “Online Application” click කරන්න. එවිට ඔබ පහත දැක්වෙන Window වෙත යොමු වේ.



**පියවර 3**

“Create New Account” Click කරන්න. එවිට ඔබ පහත දැක්වෙන Window වෙත යොමු වේ. අදාල තොරතුරු සම්පූර්ණ කර නව ගිණුමක් නිර්මාණය කරන්න.




**පියවර 4**

ඉහත පියවර සම්පූර්ණ කල පසු ඔබ පහත Window වෙත යොමු වේ.



**පියවර 5**

“Add New Application” Click කරන්න. එවිට ඔබ පහත Window වෙත යොමු වේ.

සටහන :– Programme* – Certificate in Entrepreneeship & Small Business Management




**පියවර 6**

ඉහත පියවර සම්පූර්ණ කළ පසු “Apply and Pay” Click කරන්න. එවිට ඔබ පහත Window වෙත යොමු වේ.



**පියවර 7**

අදාළ මුදල් ගෙවීමේ ක්‍රමය තෝරා ගෙන එයට අදාළව සපයා ඇති උපදෙස් පිළිපදින්න.

**පියවර 8**

මුදල් ගෙවීමේ ක්‍රියාවලිය අවසානයේ ඔබට "View" Click කිරීමෙන් අදාළ තොරතුරු පත්‍රිකාව බාගත කර ගත හැකිය.

*සටහන*

***මෙම ක්‍රියාවලිය තුළදී ඔබ යම් අපහසුතාවයකට පත් වුවහොත්, ඔබට ආසන්නතම විවෘත විශ්වවිද්‍යාලීය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ අදාළ නිලධාරීන් මුණ ගැසෙන්න.***

**වැඩිදුර විස්තර**

මහජන සම්බන්ධතා හා තොරතුරු අංශය
තැ.පෙ. අංක 21
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල
නුගේගොඩ
දුරකථන අංක –    011 - 2881327
011 – 2881256